3 සාම්ප්‍රදායික තර්ක ශාස්ත්‍රයේ (අව්‍යවහිත හා ව්‍යවහිත) අනුමාන ඇසුරෙන් සප්‍රමාණ නිගමනවලට එළඹෙයි.



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

3.1 අව්‍යහිත අනුමාන දෛනික ජීවිතයේදී ප්‍රායෝගිකව යොදාගත හැකි බව ආදර්ශනය කරයි.

ඉගෙනුම් පල :

- අනුමානයන් වර්ග කරයි.
- ප්‍රස්තුත යුගලයක් සත්‍යවීම, අසත්‍ය වීම, හෝ අවිනිශ්චිත වීමේ හැකියාව හඳුනාගනී.
- ප්‍රතියෝගය හා ආනයනය අතර වෙනස දක්වයි.
- ආනයන රීති ඇසුරෙන් සාමාන්‍ය ව්‍යවහාරයේ අනුමානවල වැරදි විශ්ලේෂණය කරයි.
- සප්‍රමාණ තර්ක ගොඩනැගීමේදී විවිධ අනුමානයන් සහය වන ආකාර අගය කරයි.



අන්තර්ගතය සකස් කිරීම:-ප්‍රීතිමා සෙනවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය කෑගල්ල
අන්තර්ගතය පරීක්ෂා කිරීම:-කථිකාචාර්ය තරංග ධරණිත මයා ,දර්ශන අධ්‍යයනාංශය,කැලණිය වි.වි
පරිගණක පිටු සැකසුම:- එම්.කේ.ඩබ්.නේමින්දා වික්‍රමරත්න මෙය ,හ/ජඳුර විද්‍යාලය,අඟුණුකොලපැලැස්ස

සාම්ප්‍රදායික තර්ක ශාස්ත්‍රයේ අනුමානය

බටහිර තර්ක ශාස්ත්‍රයෙහි නිගාමී සහ උද්ගාමී වශයෙන් අනුමාන ක්‍රම දෙකකි. නිගාමී අනුමානය දෙන ලද අවයවයන්ගෙන් බැහැරට නොයන හෙවත් අවයවයන්ට සීමා වූ නිගමනයක් ලබයි.

උදා - සියලු මිනිසුන් මැරෙන සුළුය.

ඇරිස්ටෝටල් මිනිසෙකි.

∴ ඇරිස්ටෝටල් මැරෙන සුළුය.

මේ තර්කය සප්‍රමාණ වන විට දී එහි අවයව සත්‍ය නම් නිගමනය අසත්‍ය විය නොහැක. එමෙන්ම නිගාමී අනුමානයක් ඇසුරෙන් එළඹෙන නිගමනය නිශ්චිතය. එහෙත් උද්ගාමී අනුමානය තුළ දී නිගමනය අවයවයන්ගෙන් බැහැරට ගෙනයන නිසා අවයව සත්‍ය වන විට දී නිගමනය සම්භාවිතාවයකින් යුතුය.

නිගාමී අනුමානයේ ප්‍රභේද දෙකකි.

1.අව්‍යවහිත අනුමානය

2.ව්‍යවහිත අනුමානය

අව්‍යහිත අනුමානය අතරමැදි චින්තනයකින් තොරව දී ඇති ප්‍රස්තුතයෙන් එක එල්ලේම නිගමනය කරා එයි.

උදා -

- සියලු දාර්ශනිකයින් ප්‍රඥාවන්තය.
  එහෙයින් සමහර දාර්ශනිකයන් ප්‍රඥාවන්තය.

- සියලු ගුරුවරුන් උපාධිධාරීන්ය.
  එහෙයින් උපාධිධාරීන් නොවන කිසිවෙක් ගුරුවරයෙක් නොවේ.

මෙහිදී දෙන ලද අවයවය මුල්කොටගෙන එක එල්ලේම එයින් නිගමනයක් ලබාගෙන ඇත.
ව්‍යවහිත අනුමානයේදී අවයව ප්‍රස්තුත දෙකක් මුල්කොට ගෙන නිගමනයකට එළඹේ.

උදා - සියලු දාර්ශනිකයන් උගතුන්ය.
සියලු බුද්ධිමතුන් දාර්ශනිකයන්ය.
∴ සියලු බුද්ධිමතුන් උගතුන්ය.

අව්‍යවහිත අනුමානය

අතරමැදි චින්තනයකින් තොරව දී ඇති ප්‍රස්තුතයකින් එක එල්ලේම නිගමනයකට එළඹීම අව්‍යවහිත අනුමානයේ දී දැකිය හැක. අව්‍යවහිත අනුමාන ප්‍රභේද දෙකකි.

1.ප්‍රස්තුත ප්‍රතියෝගය
2.ආනයන

ප්‍රස්තුත ප්‍රතියෝගයේදී ප්‍රස්තුත යුගලයේ සමන්විත අංග නොවෙනස් ව පවතී. එහෙත් ඒවායේ සත්‍යතාවයන් වෙනස් විය හැකිය.

උදා - සියලු ළමයි දක්ෂකාර වේ (A)
∴ සමහර ළමයි දක්ෂකාර වේ.(I)

මෙහි පළමුවැන්න සත්‍ය වන විට දෙවැන්න ද සත්‍ය වේ. එහෙත් දෙවැන්න සත්‍ය වන විට පළමුවැන්න අවිනිශ්චිතය. පළමුවැන්න අසත්‍ය විට දෙවැන්න අවිනිශ්චිතය. එහෙත් දෙවැන්න අසත්‍ය විට පළමුවැන්න අසත්‍ය වේ.
ආනයනයකදී දෙන ලද ප්‍රස්තුතයක වච්‍ය හෝ වාචකය හෝ වාච්‍ය හා වාචකය යන දෙකම වෙනස් කර අනුමානයකට එළඹෙන අතර ප්‍රස්තුත යුගලය සත්‍යතාවයෙන් වෙනස් නොවේ.

උදා - සියලු ළමයි දක්ෂකාර වේ.
∴ දක්ෂකාර නොවන කිසිවෙක් ළමයෙක් නොවේ.

මෙහි දී පළමු ප්‍රස්තුතයේ වාචකයේ විසංවාදය අනුමාන ප්‍රස්තුතයේ වාච්‍යයයි. පළමු ප්‍රස්තුතයේ වාච්‍යය අනුමාන ප්‍රස්තුතයේ වාචකයයි.නමුත් මේ ප්‍රස්තුත යුගලය සත්‍යතාවයෙන් අනුරූප වේ.

Cop

ප්‍රස්තුත ප්‍රතියෝගය

සමන්විත අංග අනුරූප ප්‍රමාණයෙන් හෝ ගුණයෙන් හෝ ප්‍රමාණය හා ගුණය යන දෙකෙන්ම වෙනස් වන ප්‍රස්තුත යුගලයක් අතර පවතින තාර්කික සම්බන්ධය ප්‍රස්තුත ප්‍රතියෝගයයි. ප්‍රස්තුත ප්‍රතියෝගයන් ප්‍රභේද 4කි.

1.උපාශ්‍රයන ප්‍රතියෝගය
2.ප්‍රත්‍යනීක ප්‍රතියෝගය
3.උප ප්‍රත්‍යනීක ප්‍රතියෝගය
4.විසංවාදී ප්‍රතියෝගය

උපාශ්‍රයන ප්‍රතියෝගය

සමන්විත අංග අනුරූප ප්‍රමාණයෙන් පමණක් වෙනස් වන ප්‍රස්තුත යුගලයක් අතර පවතින තාර්කික සම්බන්ධය උපාශ්‍රයන ප්‍රතියෝගයයි. එවිට A, I සහ E, O යන ප්‍රස්තුත යුගල අතර පවතී

උදා සියලුම මල් සුවඳවත්ය.
∴සමහර මල් සුවඳවත්ය.

කිසිම ගායකයෙක් අවංක නොවේ.
∴සමහර ගායකයෙක් අවංක නොවේ.

උපාශ්‍රයන ප්‍රතියෝගය තුළදී ප්‍රස්තුත යුගලයන් එකවර සත්‍ය මෙන්ම එකවර අසත්‍ය ද විය හැක. එනම්,

1. A සත්‍ය නම් I සත්‍ය
   E සත්‍ය නම් O සත්‍ය
2. A අසත්‍ය නම් I අවිනිශ්චිතය
   E අසත්‍ය නම් O අවිනිශ්චිතය
3. O සත්‍ය නම් E අවිනිශ්චිතය
   I සත්‍ය නම් A අවිනිශ්චිතය
4. I අසත්‍ය නම් A අසත්‍ය
   O අසත්‍ය නම් E අසත්‍ය

Copy

ප්‍රත්‍යනීක ප්‍රතියෝගය

සමන්විත අංග අනුරූප ගුණයෙන් පමණක් වෙනස් වූ සාමාන්‍ය ප්‍රස්තුත යුගලයක් අතර පවතින තාර්කික සම්බන්ධය ප්‍රත්‍යනීක ප්‍රතියෝගයයි. මෙය පවතින්නේ A, E යන ප්‍රස්තුත යුගල අතරය.

උදා සියලු ළමයි දඟකාරය.

∴කිසිම ළමයෙක් දඟකාර නොවේ.

මෙම ප්‍රස්තුත යුගලය එකවර සත්‍ය විය නොහැකි නමුත් එකවර අසත්‍ය විය හැකිය එනම්,

1. A සත්‍ය නම් E අසත්‍ය
2. E සත්‍ය නම් A අසත්‍ය
3. A අසත්‍ය නම් E අවිනිශ්චිතය
4. E අසත්‍ය නම් A අවිනිශ්චිතය

උප ප්‍රත්‍යනීක ප්‍රතියෝගය

සමන්විත අංග අනුරූප ගුණයෙන් වෙනස් වූ විශේෂ ප්‍රස්තුත යුගලයක් අතර පවතින තාර්කික සම්බන්ධය උප ප්‍රත්‍යනීකතාවයයි. මෙම සම්බන්ධය I හා O ප්‍රස්තුත යුගල් අතර පවතියි.

උදා සමහර මල් සුදු පාටය.

∴සමහර මල් සුදු පාට නොවේ.

මෙම ප්‍රස්තුත යුගලය එකවර සත්‍ය විය හැකි නමුත් අසත්‍ය විය නොහැකිය. එවිට,

1. I සත්‍ය නම් O අවිනිශ්චිතය
2. O සත්‍ය නම් I අවිනිශ්චිතය
3. I අසත්‍ය නම් O සත්‍ය
4. O අසත්‍ය නම් I සත්‍ය

අන්තර්ගතය සකස් කිරීම:-ප්‍රීතිමා සෙනවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය කෑගල්ල
අන්තර්ගතය පරීක්ෂා කිරීම:-කථිකාචාර්ය තරංග ධරණීත මයා ,දර්ශන අධ්‍යයනාංශය,කැලණිය වි.වි
පරිගණක පිටු සැකසුම:- එම්.කේ.ඩබ්.නේමින්දා වික්‍රමරත්න මෙය ,හ/ජඳුර විද්‍යාලය,අඟුණකොළපැලැස්ස

විසංවාදී ප්‍රතියෝගය

සමන්විත අංග අනුරූප ප්‍රමාණය හා ගුණය යන දෙකෙන්ම වෙනස් වූ ප්‍රස්තුත යුගලයක් අතර ඇති තාර්කික සම්බන්ධය විසංවාදයයි. ඒ අනුව මෙම සම්බන්ධය පවතින්නේ A, Oසහ E, I අතරයි.

උදා :- සියලු පළතුරු ඉදී ඇත.

∴ සමහර පළතුරු ඉදී නැත.

කිසිම පාලකයෙක් අවංක නොවේ.

∴ සමහර පාලකයින් අවංක වේ.

මෙම ප්‍රස්තුත යුගලය එකවර සත්‍ය වන්නේවත් අසත්‍ය වන්නේවත් නැත. එනම්,

1. A සත්‍ය නම් O අසත්‍ය
2. A අසත්‍ය නම් O සත්‍ය
3. E සත්‍ය නම් I අසත්‍ය
4. E අසත්‍ය නම් I සත්‍ය
5. I සත්‍ය නම් E අසත්‍ය
6. I අසත්‍ය නම් E සත්‍ය
7. O සත්‍ය නම් A අසත්‍ය
8. O අසත්‍ය නම් A සත්‍ය

මේ අනුව විසංවාදය තුළදී ප්‍රස්තුත යුගලයෙන් වරකට සත්‍ය/අසත්‍ය වනුයේ එකක් හා එකක් පමණි.

සාම්ප්‍රදායික ප්‍රතියෝග



<u>සාම්ප්‍රදායික ප්‍රතියෝග චතුරස්‍රයට අදාල සත්‍යතා වගුව</u>

දෙන ලද ප්‍රස්තුතය	A	E	I	O
A සත්‍ය නම්	-	F	T	F
A අසත්‍ය නම්	-	D	D	T
E සත්‍ය නම්	F	-	F	T
Eඅසත්‍ය නම්	D	-	T	D
I සත්‍ය නම්	D	F	-	D
I අසත්‍ය නම්	F	T	-	T
O සත්‍ය නම්	F	D	D	-
O අසත්‍ය නම්	T	F	T	-

T- සත්‍ය වේ

F - අසත්‍ය වේ

D - අවිනිශ්චිත වේ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

ප්‍රතියෝග පිළිබඳ නූතන විග්‍රහය

ජෝජ් බූල් නැමැත්තා ප්‍රතියෝගය පිළිබඳ කරන විග්‍රහය විසංවාදයට පමණක් සීමා කරයි. ඔහු පවසන ආකාරයට නිගාමී අනුමානයක් තුළ ලබා දෙන නිගමනය නිශ්චිත විය යුතුය. විසංවාදය හැරුණු විට අනෙකුත් ප්‍රතියෝග තුළ ලබන අනුමාන අවිනිශ්චිත වන අවස්ථා ද ඇත. ඒ නිසා නියමයන්ට පූර්ණ එකඟතාවයක් ඇත්තේ විසංවාදී ප්‍රතියෝගයයි.

චින්තන නියම සැලකිල්ලට ගත් විට ද මධ්‍ය බහිෂ්කරණය සහ අවිසංවාදය යන චින්තන නියමයන් දෙකම සමග විසංවාදී ප්‍රතියෝගය ගැළපේ. එමෙන්ම කුලකවාදය සහ ගණිතමය තර්ක ශාස්ත්‍රය සමග ද විසංවාදී ප්‍රතියෝගය ගැළපීමක් ඇත. එම නිසා ජෝර්ජ් බූල් ප්‍රතියෝගය සම්බන්ධයෙන් කරන විග්‍රහය විසංවාදයට පමණක් සීමා කරයි.

ආනයන

දෙන ලද ප්‍රස්තුතයක වාච්‍ය හෝ වාචකය හෝ වාච්‍ය හා වාචකය යන දෙකම හෝ වෙනස්කර මූලික ප්‍රස්තුතයට සත්‍යතාවයෙන් අනුරූප අනුමාන ප්‍රස්තුතයක් කරා එළඹීම ආනයනයක් වේ.

උදා සියලු <u>ගුරුවරු</u> උපාධිධාරීන් වේ.
∴<u>ගුරුවරු නොවන</u> සමහරු උපාධිධාරීන් නොවේ.

කිසිම ළමයෙක් <u>කීකරු</u> නැත.
∴එහෙයින් සියලු ළමයි <u>අකීකරුය.</u>

ආනයනයන් හී ප්‍රභේද 4කි.

1.ප්‍රතිවර්තනය
2.පරිවර්තනය
3.පරස්ථාපනය
4.ප්‍රතිලෝමනය

Copyright © www.ethaksalawa.moe.gov.lk

ප්‍රතිවර්තනය

දෙන ලද ප්‍රස්තුතයක වාචකයෙහි විසංවාදය අනුමිත ප්‍රස්තුතයේ වාචකය වශයෙන් ගෙන ගුණයෙන් වෙනස් වූ ආනයන ප්‍රස්තුතයක් ලබා ගැනීම ප්‍රතිවර්තනයයි. සප්‍රමාණ ප්‍රතිවර්තනයකදී පහත රීති අනුගමනය කරයි.

1.දෙන ලද ප්‍රස්තුතයේ වාචකයේ විසංවාදය අනුමිත ප්‍රස්තුතයේ වාචකය විය යුතුය.

2.අනුමිත ප්‍රස්තුතය දෙන ලද ප්‍රස්තුතයට ගුණයෙන් වෙනස් විය යුතුය.

3.අනුමිත ප්‍රස්තුතය දෙන ලද ප්‍රස්තුතයට ප්‍රමාණයෙන් වෙනස් නොවිය යුතුය.

දෙන ලද ප්‍රස්තුතය (ප්‍රතිවර්තිතව්‍ය)	SP	A	E	I	O
අනුමිත ප්‍රස්තුතය (ප්‍රතිවර්තිතය)	S$\bar{P}$	E	A	O	I

01. සියලු ළමයින් කීකරු වේ.
∴ කිසිම ළමයෙක් අකීකරු නොවේ.

02. කිසිම රජෙක් නීච වැඩ නොකරයි.
∴ සියලු රජවරු නීච වැඩ නොකරන අය වේ.

3. සමහර ගුරුවරු උපාධිධාරීන් වේ.
∴ සමහර ගුරුවරු උපාධිධාරීන් නොවන අය නොවේ.

04. සමහර අඹ ඉදී නැත.
∴ සමහර අඹ ඉදී නැත්තේ වේ.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

පරිවර්තනය

දෙන ලද ප්‍රස්තුතයක වාච්‍ය හා වාචකය හුවමාරු කර මූලික ප්‍රස්තුතයට සත්‍යතාවයෙන් අනුරූප අනුමාන ප්‍රස්තුතයක් කරා එළඹීම පරිවර්තනයයි. සප්‍රමාණ පරිවර්තනයක් සඳහා පහත රීතීන් අනුගමනය කෙරේ.

1. දෙන ලද ප්‍රස්තුතය හා අනුමිති ප්‍රස්තුතය අතර වාච්‍ය වාචකය එකිනෙකින් හුවමාරු විය යුතුය.
2. දෙන ලද ප්‍රස්තුතයේ අව්‍යාප්ත වූ පද ආනයන ප්‍රස්තුතයේ දීත් අව්‍යාප්තවම පැවතිය යුතුය.
3. අනුමිත ප්‍රස්තුතය දෙන ලද ප්‍රස්තුතයේ ගුණයට සමාන විය යුතුය.

දෙන ලද ප්‍රස්තුතය (ප්‍රතිවර්තිතව්‍ය)	SP	A	E	I	O
අනුමිත ප්‍රස්තුතය (ප්‍රතිවර්තිතය)	PS	I	E	I	-

01. සියලු ළමයින් කීකරු වේ.
∴ කීකරු සමහරෙක් ළමයි වේ.

02. කිසිම පාලකයෙක් දූරදර්ශී නොවේ.
∴ කිසිම දූරදර්ශී අයෙක් පාලකයෙක් නොවේ.

03. සමහර ගුරුවරු උපාධිධාරීන් වේ.
∴ උපාධිධාරීන් සමහරෙක් ගුරුවරු වේ.

04. සමහර පොත් නවකතා නොවේ.
මෙහි සප්‍රමාණ පරිවර්තනයක් නැත

O ප්‍රස්තුතයක වාච්‍ය අව්‍යාප්ත වේ. පරිවර්තනයේ දී එය වාචකයට මාරුකර අව්‍යාප්තවම තැබිය යුතු අතර ගුණය ද වෙනස් නොකළ යුතුය. එම කොන්දේසි දෙක එක විට සම්පූර්ණ කළ නොහැක.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

ප්‍රතිවර්ත්‍ය පරිවර්තනය

පරිවර්තිතය නැවත ප්‍රතිවර්තනය කිරීමෙන් ලබන අනුමානය ප්‍රතිවර්ත්‍ය පරිවර්තනයයි.

දෙන ලද ප්‍රස්තුතය	SP	A	E	I	O
පරිවර්තිතය	PS	I	E	I	-
ප්‍රතිවර්ත්‍ය පරිවර්තිතය	P$\overline{S}$	O	A	O	-

උදා -

01. සියලු පක්ෂීන් පළතුරු ආහාරයට ගන්නවුන් වේ .
∴පළතුරු ආහාරයට ගන්නා සමහරු පක්ෂීන් නොවන්නන් නොවේ.

02. කිසිම ස්ත්‍රියෙක් අවංක නැත.
∴අවංක සියලු දෙනා ස්ත්‍රීන් නොවන්නවුන් වේ.

03. සමහර උගතුන් රටහැර යන්නවුන් වේ.
∴රටහැර යන සමහරු නූගතුන් නොවේ.

පරස්ථාපනය

දෙන ලද ප්‍රස්තුතය ප්‍රතිවර්තනයට ලක් කිරීමෙන් අනතුරුව පරිවර්තනයෙන් ලැබෙන අනුමානය පරස්ථාපනයයි. නොඑසේ නම් දෙන ලද ප්‍රස්තුතයක වාචකයේ විසංවාදය වාච්‍ය ලෙස ඇති ගුණයෙන් වෙනස් වූ අනුමාන ප්‍රස්තුතයක් කරා එළඹීම පරස්ථාපනයයි.

සප්‍රමාණ පරස්ථාපන රීති,

1.දෙනලද ප්‍රස්තුතයේ වාචකයේ විසංවාදය ආනයන ප්‍රස්තුතයේ වාච්‍යය වේ.
2.ආනයන ප්‍රස්තුතය දෙන ලද ප්‍රස්තුතයට ගුණයෙන් වෙනස් වේ.
3.දෙන ලද ප්‍රස්තුතයේ ප්‍රතිවර්තිතයේ අව්‍යාප්ත පද පරස්ථාපිතයේත් අව්‍යාප්ත වේ.

Copyright © www.ethaksalawa.gov.lk

දෙන ලද ප්‍රස්තුතය	SP	A	E	I	O
ප්‍රතිවර්තිතය	$S\bar{P}$	E	A	O	I
පරිවර්තනය (පරස්ථාපනය)	$\bar{P}S$	E	I	-	I

උදා -

01. සියලු ගුරුවරු සුදුසුකම් සපුරා ඇත.

∴ සුදුසුකම් සපුරා නැති කිසිවෙක් ගරුවරයෙක් නොවේ.

02. උපාය දන්නා කිසිවෙක් අපායේ නොවැටේ.

∴ අපායේ නොවැටෙන සමහරු උපාය දන්නවුන් වේ.

03. I ප්‍රස්තුත සප්‍රමාණව පරස්ථාපනය කළ නොහැක. හේතුව O ප්‍රස්තුතයේ වාච්‍ය අව්‍යාප්තය.
පරිවර්තනයේදී එය වාචකයට මාරු කර අව්‍යාප්තව තැබිය යුතු අතර ගුණය වෙනස් නොකළ යුතුය.
එම අවශ්‍යතා දෙක එකවර සම්පූර්ණ කළ නොහැක. එබැවින් I ප්‍රස්තුතයට සප්‍රමාණ පරස්ථාපනයක් නැත.

04. සමහර ගුරුවරු උපාධිධාරීන් නොවේ.

∴ සමහර උපාධිධාරීන් නොවන අය ගුරුවරු වේ.

දෙන ලද ප්‍රස්තුතය	SP	A	E	I	O
පරස්ථාපිතය	$\bar{P}S$	E	I	-	I

<u>ප්‍රතිවර්ත්‍ය පරස්ථාපනය</u>

පරස්ථාපනය නැවත ප්‍රතිවර්තනය කිරීමෙන් ලබන අනුමානය ප්‍රතිවර්ත්‍ය පරස්ථාපනයයි.

අන්තර්ගතය සකස් කිරීම:-ප්‍රීතිමා සෙනවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය කෑගල්ල
අන්තර්ගතය පරීක්ෂා කිරීම:-කථිකාචාර්ය තරංග ධරණිත මයා ,දර්ශන අධ්‍යයනාංශය,කැලණිය වි.වි
පරිගණක පිටු සැකසුම:- එම්.කේ.ඩබ්.නේමින්දා වික්‍රමරත්න මෙය ,හ/ජදුර විද්‍යාලය අඟුණුකොළපැලැස්ස

Copyright © www.e-thaksalawa.moe.gov.lk

දෙන ලද ප්‍රස්තුතය	SP	A	E	I	O
ප්‍රතිවර්තනය	$S\bar{P}$	E	A	O	I
පරිවර්තනය (පරස්ථාපනය)	$\bar{P}S$	E	I	-	I
ප්‍රතිවර්තනය	$\bar{P}\bar{S}$	A	O	-	O

01. සියලු විත්තිකරුවන් වැරදිකරුවන් වේ.
   - ❖ නිවැරදිකරුවන් සියලුදෙනා විත්තිකරුවන් නොවන්නෝ වේ.

02. නේවාසිකයින් කිසිවෙකුට ඡන්දය හිමි නොවේ.
   - ❖ ඡන්දය අහිමි සමහරු අනේවාසිකයන් නොවේ.

03. සමහර පළතුරු ඇඹුල් රස නොවේ.
   - ❖ ඇඹුල් රස නොවන සමහරක් පළතුරු නොවන ඒවා නොවේ.

ප්‍රතිලෝමනය

දෙන ලද ප්‍රස්තුතයක වාච්‍යයෙහි විසංවාදය වාච්‍යය වශයෙන් ඇති ගුණයෙන් වෙනස් වූ විශේෂ ප්‍රස්තුතයක් අනුමාන කිරීම ප්‍රතිලෝමනයයි. ප්‍රතිලෝමනයට සාමාන්‍යය ප්‍රස්තුත පත් වේ. ප්‍රතිලෝමිතය ගුණයෙන් වෙනස් වුණු විශේෂ ප්‍රස්තුතයකි.

දෙන ලද ප්‍රස්තුතය	SP	A	E	I	O
ප්‍රතිලෝමිතය	$\bar{S}P$	O	I	-	-

උදා -

01. සියලු නේවාසිකයන්ට ඡන්දය හිමි වේ.
   ∴ අනේවාසිකයන් සමහරක්ට ඡන්දය හිමි නොවේ.

02. කිසිම විනිශ්චයකරුවෙක් පක්ෂපාතී නොවේ.
   ∴ සමහර විනිශ්චයකරුවන් නොවන අය පක්ෂපාතී වේ.

Copyright www.ethaksalawa.lk gov.lk

පියවර අනුක්‍රමනයෙන් ප්‍රතිලෝමනයට නැගීමේදී A ප්‍රස්තුතයක් දෙන ලද විට ප්‍රතිවර්තනයෙන් ඇරඹී අනතුරුව පරිවර්තනය යළි ප්‍රතිවර්තනය ආදී වශයෙන් ප්‍රතිවර්තන හා පරිවර්තන ක්‍රියාවලිය මාරුවෙන් මාරුවට කිරීමෙන් දී ඇති ප්‍රස්තුතයේ වාචයයේ විසංවාදය ගුණයෙන් වෙනස් වූ ප්‍රස්තුතයකට එළඹේ.

E ප්‍රස්තුතයක් දෙන ලද විට මේ ක්‍රියා වලිය ඇරඹෙන්නේ පරිවර්තනයෙනි. අනතුරුව ප්‍රතිවර්තනයත්, යළි පරිවර්තනයත් කළ විට ප්‍රතිලෝමනය ලැබේ.

<u>ප්‍රතිවර්තය ප්‍රතිලෝමනය</u>

ප්‍රතිලෝමනය නැවත ප්‍රතිවර්තනය කිරීමෙන් ලැබෙන අනුමානය ප්‍රතිවර්තය ප්‍රතිලෝමනයයි.

දෙන ලද ප්‍රස්තුතය	SP	A	E	I	O
ප්‍රතිවර්තය ප්‍රතිලෝමිතය	$\bar{S}\bar{P}$	I	O	-	-

උදා -

01. සියලු උපාධිධාරීන් සේවා නියුක්ත වේ.
∴සමහර උපාධිධාරීන් නොවන්නන් සේවා වියුක්ත වේ.

02. උගතුන් කිසිවෙක් හිංසාවාදී නොවේ.
∴නූගතුන් සමහරු අවිහිංසාවාදී නොවේ.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම:-ප්‍රීතිමා සෙනවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය කෑගල්ල
අන්තර්ගතය පරීක්ෂා කිරීම:-කථිකාචාර්ය තරංග ධරණීත මයා ,දර්ශන අධ්‍යයනාංශය,කැලණිය වි.වි
පරිගණක පිටු සැකසුම:- එම්.කේ.ඩබ්.නේමින්දා වික්‍රමරත්න මෙය ,හ/ජඳුර විද්‍යාලය,අඟුණුකොලපැලැස්ස